කුරුණෑගල මහා  නගර සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වූ කර්මාන්ත 7 ක් වෙනුවෙන් සභාව වෙත ලැබිය යුතුව තිබූ රු.2,703,747 ක මුදලක් ප්‍රාග්ධන ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර, තවත් කර්මාන්ත 3 ක් වෙනුවෙන් ලැබී තිබුණු එකතුව රු.886,985 ක මුදලක් ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.51,126,456 ක ප්‍රමාණය ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). පෞද්ගලික සමාගමකින් 2006 වර්ෂයේ අයවිය යුතුව පැවති රු. 6,762,000 ක් වූ හිඟ වාහන නැවතුම් ගාස්තුවේ නිවැරදිතාවය තහවුරු කරගෙන ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුලදී කුරුණෑගල බස් නැවතුම්පලේ උඩුමහල කඩ කාමර 05 ක් වෙනුවෙන් ඉදිරි වර්ෂයන් සඳහා ලැබී තිබුණු රු.415,891 ක් වූ පෙර ගෙවුම් මුදල් හා ඊට අදාල රු.143,198 ක පොළිය ඉදිරියට ලැබීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. එමෙන්ම වර්ෂය අවසානයට ඉහත සඳහන් රු.559,089 ක මුදල හිඟ කඩකුලී වලින් අඩුකර දැක්වීම හේතුවෙන් ප්‍රාග්ධන ලැබීම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ). කඩකුලී ලේඛණය අනුව අර්ධ ස්ථිර කඩ කාමර 9 කින් ලැබිය යුතුව පැවති රු.28,861 ක මුදල හා නව බස් නැවතුම්පල උඩුමහලෙහි කඩ කාමර 4 කින් ලැබිය යුතු රු.142,082 ක හිඟ කුලී ආදායම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව පැවති මුද්දර ගාස්තු ආදායම් ණයගැතියෝ වටිනාකම රු.5,070,465 ක් වුවද, මූලා ප්‍රකාශනවලට එය රු.546,998 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායම් ණයගැතියෝ රු.4,523,467 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(උ). බස්නැවතුම්පල පිරිසිදු කිරීම බදු දීමට අදාල ලිපි ලේඛණ අනුව තහවුරු වූ හිඟ බදු ආදායම රු.5,230,880 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ). ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු.606,897ක් වූ බස් නැවතුම්පල පෙර ගෙවුම් මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබූ අතර, 2012 වර්ෂයේදී සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,459,300 ක් වූ ට්‍රැක්ටරය හා ට්‍රේලරයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතුව පැවති ශේෂය රු.51,126,456 ක්ව තිබුණි.

1.3.3 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාල ලැබීම්, බිල් කිරීම් හා අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් 18 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව වූ අනුරූපී අගයන් අතර රු .24,219,747 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.90,920,365 ක් වූ අතර, එයින් රු.83,504,069 කට අදාලව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොවුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වල වටිනාකම රු.107,375,407 ක් වූ අතර, එයින් රු.37,816,297 ක්ම වසර 1 කට වැඩි කාලයකට අදාල විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු .162,969,938 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.89,067,127 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,330,174 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,736,953 ක වර්ධනයක් පැවතුණි. මූල්‍ය ප්‍රතිඵලයට රු.5,250,235 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.64,965,055 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.29,352,307 ක් විය.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.421,792,280 න් සියයට 38 ක් ලෙස රු.159,384,751 ක්ම උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.5,250,235 ක ප්‍රමාණය පෙර ගෙවුම් මුදල් (කීමනී) හා පරිත්‍යාග වලින් සමන්විත වූ අතර, ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.332,725,153 න් සියයට 49 ක් ලෙස රු.161,846,100 ක්ම පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 58 ක් ලෙස රු.94,403,086 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.64,965,055 න් සියයට 41 ක් ලෙස රු.26,457,126 ක් සභා අරමුදලින් සිදුකළ සංවර්ධන කාර්යයන් වූ අතර, ඉතිරි සියයට 59 ක් ලෙස රු.38,507,929 ක මුදල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් හා වැඩිදියුණු කිරීම් සඳහා වැය කර තිබුණි. තවද ගමනැගුම , මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් හඳුනාගෙන ප්‍රාග්ධන වැය ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

2.3 <u>කාරක ප්‍රාග්ධන කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ව්‍යාපෘති වැඩ කටයුතු අවසන්ව තිබීම හෝ අක්‍රීයව පැවතීම හේතුවෙන් ඒවාට අදාල ඉතිරි කිරීමේ ගිණුම් 07 ක සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,087,803 ක ශේෂයක් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට අයවීම හිඟ හිටි සේවක ණය ශේෂය රු.837,131 ක් වූ අතර, ඉන් රු.334,468 ක් අවුරුදු 3 ට වඩා වැඩි හිඟ හිටි ණය ශේෂ විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් ඒකක 13320 ක් සඳහා රු.45,068,061 ක වරිපනම් ආදායමක් බිල්කර තිබුණු අතර, ඉන් සියයට 51 ලෙස රු.23,081,050 ක හිඟයක් පැවතුණි. 2014 ජූලි 30 දින වන විට මෙම හිඟයෙන් රු.1,207,816 ක් අයකරගෙන තිබුණු අතර තවදුරටත් රු.21,873,234 ක හිඟයක් පැවතුණි.

2.4.2 ජල ගාස්තු

වාර්ෂික ජල බිල්කිරීම් රු.84,329,924 ක් වූ අතර, ඒ යටතේ සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.42,518,584 ක හිඟයක් පැවතුණි. විගණනයේදී සිදුකල සෝදිසි පරීක්ෂාව අනුව රු.50,000 ත් රු.100,000 ත් අතර හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 55 කට අදාලව එකතු වටිනාකම රු.2,731,711 ක හිඟයක්ද, රු.100,000 ට වැඩි හිඟයක් පවතින ජල පාරිභෝගිකයින් 31 කට අදාලව රු.16,271,803 ක හිඟයක්ද නිරීක්ෂණය විය. එමෙන්ම පාරිභෝගික අංක තුනකට අදාලව නාගරික කොමසාරිස් ලෙස බිල් කල රු.3,824,306 ක හිඟයක්ද පාරිභෝගික අංක 5163 යටතේ කුරුණෑගල ශික්ෂණ රෝහලට අදාලව රු.10,618,524 ක හිඟයක්ද පැවතුණි.

2.4.3 කඩකුලී

සමාලෝචිත වර්ෂය අවසානයට කුරුණෑගල නව බස් නැවතුම්පල කඩ කාමර 51 කට අදාලව කුලිය හා ප්‍රමාද ගාස්තුව සමඟ රු.1,412,438 ක හිඟයක්ද, පෙර ගෙවුම් මුදල් හා ඊට අදාල පොලී ලෙස රු.2,431,146 ක හිඟයක්ද පැවතුණි. ඉන් මාස 06 ත් මාස 78 ත් අතර කාලයක සිට හිඟව පවතින කඩ කාමර 14 කට අදාලව රු.2,126,961 ක හිඟයක් පැවතිණි.

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.462,375 ක් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.30,339,894 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). කඩ කාමර 196 කින් සමන්විත නව සාප්පු සංකීර්ණය සඳහා රු.මිලියන 18.9 ක කුලී ආදායමක් වාර්ෂිකව බිල් කර තිබුණ ද විදුලිය, සේවා ගාස්තු හා භාරකරු වැටුප් යනාදී වියදම් සඳහා වාර්ෂිකව රු. මිලියන 15.7 ක් පමණ වැයවීම හේතුවෙන් ප්‍රමාණවත් අතිරේක ආදායම් උත්පාදනයක් ඒ යටතේ සිදුව නොතිබුණි. එමෙන්ම මෙම වියදමින් සියයට 80 (රු.මිලියන 15) ක් පමණම විදුලිය සඳහා වැය වී තිබුණි. සාප්පු සංකීර්ණයේ ඉහළ මහල් වල පැවති ජල ටැංකි වෙත ජලය ලබාදීම, පොම්ප කිරීම මගින් සිදුකර තිබූ අතර එලෙස පොම්ප කරනු ලබන ජලය හා ජල ටැංකි වෙතින් බෙදාහරින ජල ප්‍රමාණයන් හඳුනාගැනීම සඳහා වෙනම ජල මනුද සවිකර නොතිබුණි.

(ආ). කුරුණෑගල පිහිටි රජපිහිල්ල තානායම නවීකරණය කර වර්ග අඩි 11138 හා වර්ග අඩි 1741 ක් බැගින් වූ කොටස් දෙකක් කුලියට දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. ඉදිකිරීම්වල පවතින විවිධ අඩුපාඩු නිසා ටෙන්ඩර්කරුවන් ගිවිසුම් ගතවීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර, ඒ හේතුවෙන් තානායම කුලියට දීමට නොහැකිව තිබුණි.

(ඇ). සභාව විසින් 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලය තුල ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමත කිරීම් 535 ක් සිදුකලද අනුකූලතා සහතික 202 ක් පමණක් ලබාදී තිබුණි. කාලය දීර්ඝ කරවා නොගැනීම් 333 පිළිබඳව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. කෙසේ වුවද සියළු ඉදිකිරීම් අවසන්ව පැවතියේ නම් අනුකූලතා සහතික නිකුත් නොකිරීම මත අයකරගත හැකිව තිබූ රු.66,600 ක ආදායම හෝ සියළු ඉදිකිරීම් අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම මත අයකරගත හැකිව තිබූ රු.169,600 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) කුරුණෑගල නගරය අඩු කාබනික සණත්වයක් ඇති නගරයක් බවට පත්කිරීම සඳහා සුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ආසියානු තාක්ෂණික ආයතනය (ATI) මගින් 2011 මාර්තු මාසයේදී ලබාදී තිබූ රු.1,000,000 ක් (ඇ.එ.ඩො.10,000) ක ප්‍රදානයෙන් අදාල මුදල් ලබාදී වසර 2 ක පමණ කාලයකට පසුව රු.100,000 ක් ව්‍යාපෘති වාර්තාවක් සැකසීම සඳහා වැය කර තිබුණු අතර ඉතිරි රු.900,000 ක මුදල 2013 පෙබරවාරි මාසයේදී තායිලන්තයේ විදේශ සංචාරයක් සඳහාද වැයකර තිබුණි. එහෙත් එකී සංචාරයේ අත්දැකීම්, නිර්නායක පදනම් කර සකස් කල ව්‍යාපෘති වාර්තාවක් හෝ අඩු කාබනික සණත්වයක් ඇති නගරයක් බවට කුරුණෑගල නගරය පත්කිරීම සඳහා පිළියෙල කරන ලද වැඩ සැලැස්මක් නිරීක්ෂණය නොවීය.

3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

(අ). සභාව විසින් 2012 වර්ෂයට හා 2013 වර්ෂයට ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අනුමත කර තිබුණු මිළ ගණන් හා එකී භාණ්ඩ වලට අදාල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාවල වූ මිල ගණන් සමඟ සැසඳීමේදී සභාවට සපයන ලද වැලි, ගල් හා ABC වැනි ගොඩනැගිලි ද්‍රව්‍යවලට අදාලව රු.391,159 ක වැඩිපුර ගෙවීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) කුරුණෑගල බස්නැවතුම්පොල පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත්තුව 2008 වර්ෂයේ සිටම ලබාගෙන තිබූ පෞද්ගලික ආයතනයෙන් 2014 ජූලි 30 දිනට බදු කුලී ලෙස රු.5,230,880ක් හා ජල ගාස්තු ලෙස රු.3,360,880 ක් අයවිය යුතුව පැවති අතර ඉංජිනේරු අංශය විසින් නඩත්තු කරන ලද අංක MED/WC/C2/22 දරන ගොනුව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට බදු කුලී හිඟය පමණක් දක්වා තිබුණි.

3.3 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත රු.මිලියන 40 පමණ වැයකර 2012 වර්ෂයේදී ඉදිකල වැහැර සාප්පු සංකීර්ණයේ සියයට 10 ක පමණ කොටසක බිම සකස් කිරීම හා ආවරණය කිරීම කර නොතිබුණි. ඉදිකිරීම් නිමකර තිබූ බිම් මහලෙහි අවම මාසික කුලිය රු.150,000 ක් වූ වර්ග අඩි 3500 ක් පමණ වූ කොටසක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කුලියට දීමට නොහැකි වී තිබුණි. මාසික කුලිය රු.250,000 කට ගොඩනැගිල්ලේ වර්ග අඩි 7320 පමණ කොටසක් ලබාගත් ස.තො.ස. ආයතනය සඳහා අදාල ගොඩනැගිල්ලේ වූ වාහන නැවතුම් ස්ථානයද ගබඩා පහසුකම් සඳහා ලබාදීමට සිදුව තිබුණි. එමෙන්ම මෙහි අතිරේක වැඩ ලෙස ගොඩනැගිල්ල ඉදිරිපස ප්‍රධාන පාරට මුහුණලා වර්ග අඩි. 2500 ක පමණ ප්‍රමාණයක වහලයක් හා බිම් ගල් ඇතිරීම සඳහා සභා අරමුදලින් රු.2,372,755 ක් 2012 වර්ෂයේදී වැයකර තිබුණද, ආසන්න මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් අදාල ඉදිකිරීම් ඉවත් කිරීමට සිදුව තිබුණි. වර්තමානය වන විට ගොඩනැගිල්ලෙහි ස්ථාන කිහිපයක පැළුම් ඉරි පැවති අතර කුලියට නොදුන් කොටසෙහි වීදුරු රාමුවට අදාල බීඩින් පටි බුරුල් වී ගැලවී ඇති ස්ථාන පැවති බව නිරීක්ෂණය විය.

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.6,850,000 ක් වටිනා සුභසාධන කාර්යයන් 06 ක් හා රු.265,800,000 ක් වටිනා ප්‍රාග්ධන කාර්යයන් 09 ක් භෞතික හා මූල්‍ය සම්පත් සපයා ගැනීමට අපහසු වීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

4.2 නොවිසඳී ඇති විගණන විමසුම්

2011 විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි පාරිභෝගික අංක 5163 (කුරුණෑගල ශික්ෂණ රෝහල) ට අදාලව මනු කියවීමේ දෝෂ හේතුවෙන් 2007 වසරේ ජූනි සිට 2008 වසරේ ජූනි කාලයට අදාලව රු.5,229,822 ක ජල ගාස්තුවක් ( එකතු කළ අගය මත බදු සහිතව) අඩුවෙන් ගණනය කර තිබූ අතර මෙම ගණනය කිරීමේ දෝෂය මත පැනනැගී ඇති හිඟය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල්ව නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය